# 11. සාරාංශය

## සාරාංශකරණය

කිසියම් ඡේදයක සාරවත් කොටස ඉස්මතු කර දැක්වීම සාරාංශකරණයෙන් බලාපොරොත්තු වේ. අදහසක් විස්තර කර ලිවීම මෙන් ම හකුළුවා ලිවීම ද වැදගත් ය. කිසියම් කඳක අනවශ්‍ය කොටස් ඉවත් කර හරය වන අරටුව පමණක් ලබාගන්නා සේ විස්තරාත්මක පාඨයක මුඛ්‍යාර්ථයට හානියක් නොවන පරිදි එහි උපමා, රූපක, විශේෂණ හා අලංකාර වැනි පද ඉවත් කර අර්ථය ලබා ගැනීම සාරාංශ කිරීමේ දී සිදු විය යුතු ය. පාඨයක් සාරාංශ කිරීම මගින් පරීක්ෂාවට ලක් කෙරෙන්නේ පාඨය කියවා එහි අන්තර්ගතය ග්‍රහණය කර ගැනීමේ හැකියාව මෙන් ම එය නිවැරදි ලෙස ලියා දැක්වීමේ හැකියාව කොතරම් ප්‍රමාණයට ඔබ සතුව ඇත් ද යන්න යි.

දීර්ඝ දේශන, ලිපි ආදිය කියවීමෙන් අවශ්‍ය කරුණු සාරාංශ කොට තබා ගැනීමට අපට සිදු වේ. එදිනෙද ජීවිතයේ අප අවට පරිසරයේ බොහෝ දේ අපට අසන්නට දකින්නට ලැබෙන අතර ඇතැම් විශේෂිත දෙයක් වේ නම් ඒවා අප හිත මිතුරන් සමග පැවසීම සාමාන්‍ය දෙයකි. අපට විවිධ තොරතුරු සන්නිවේදනය කරනු ලබන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් ලබා ගන්නා තොරතුරු සංක්ෂිප්ත කර ඉදිරිපත් කරනු ලබන අතර අප ද ඒවා තවත් කෙනෙකුට පවසන්නේ එහි ද සාරාංශයක් හැටියට යි.

කාර්ය බහුල අවිවේකී ජීවිත ගත කරන මිනිසා තම කටයුතු ඉතා ඉක්මනින් නිම කර ගැනීමට කැමැත්තක් දක්වයි. එහි දී අප සන්නිවේදනය කරනු ලබන පණිවුඩය ඉතා සරල ව කෙටි කාලයක් තුළ සංක්ෂිප්ත ව ඉදිරිපත් කළ යුතු වේ. එහි දී සාරවත් හා වැදගත් අදහස් තෝරා බේරා ගත යුතු ය.

### අනුරපුරට මහ වැසි

අනුරාධපුර වාර්තාකරු
එල්.බී. ජයන්ත

දින කීපයක් පුරා උතුරු මැද පළාතට ඇද හැලෙන ධාරානිපාත වර්‍ෂාව තවමත් අඩු වී නැත. නුවර වැව, තිසා වැව මේ වන විට වාං දමමින් පවතී. අනුරාධපුරයට ළඟා විය හැකි මහාමාර්ග සියල්ල ජලයෙන් යට වී ඇත. දිස්ත්‍රික් ලේකම්තුමා මහ ජනතාවට සිදු වී ඇති හානිය අවම කර ගැනීම සඳහා අවශ්‍ය ආරක්‍ෂක විධිවිධාන යොදා ඇත.

මෙම පුවත පුවත්පතකින් කියවූ මල්හාමි වෙල්යායට යාමට පිටත් විය. අතර මග දී මල්හාමිට මුණගැසුණේ පැරණි හිතවතෙකු වූ රන්බණ්ඩා ය. රන්බණ්ඩා දුර ගමනක් යාම සඳහා ලක ලැහැස්ති වී පැමිණේ.

**මල්හාමි** - රන්බණ්ඩා, කොහෙ ද මේ අරුමැක්කෙ?
**රන්බණ්ඩා** - මම යනවා, අනුරාධපුරේ මහ ගෙදර ගිහින් එන්ට.
**මල්හාමි** - මොනවා අනුරාධපුරේ ?
**රන්බණ්ඩා** - ඇයි එහෙම කීවේ ?
**මල්හාමි** - අනුරාධපුරයට මහවැස්ස. නුවර වැව, තිසා වැව වාං දමනවා. පාරවල් යට වෙලා. දිස්ත්‍රික් ලේකම්තුමා ආරක්ෂක විධි විධාන යොදවලා.
**රන්බණ්ඩා** - අනේ මම දන්නේ නෑනේ. එහෙම දෙයක්.
**මල්හාමි** - අන්න අද පත්තරේ තියෙනවා. ගිහින් බලන්න කෝ.
**රන්බණ්ඩා** - මල්හාමි විස්තරේ කීවාට බොහෝ ම පිං. මං කඩමණ්ඩියට යන්නම්කෝ.

මල්හාමි කියවූ පුවත්පත් වාර්තාව හා එම වාර්තාව රන්බණ්ඩාට පැවසූ අකාරය විමසා බලමු. මල්හාමි පුවත්පතින් කිය වූ වාර්තාවේ වචන පනහක් පමණ ඇතුළත් වේ. නමුත් රන්බණ්ඩාට මල්හාමි දක් වූ වාර්තාවේ වචන ගණන දහ හතක් පමණ ය. පුවත්පත් වාර්තාවේ වචන ගණන 1/3 ක් පමණ වන සේ අඩු වී ඇත. මූලික අදහසේ කිසිවක් ඉන් ගිලිහී ද නැත. අලුතින් නව අදහස් එක් වීමක් ද නැත. තිබෙන අදහස මල්හාමිගේ වචනවලින් ඒ ඇසුරින් ම

ඉදිරිපත් වී ඇත. රන්බණ්ඩාට මල්හාමි පවසන්නේ තමා කිය වූ වාර්තාව ඉතා සංක්ෂිප්තව ය. අනුරපුරට ගංවතුර ගැලීමට හේතු වී ඇත්තේ මහා වර්ෂාවයි. මල්හාමි ඒ බව වටහා ගෙන ඇත. ඒ අනුව අපට පැහැදිලි වන්නේ මල්හාමි පුවත්පත් වාර්තාවේ මුඛ්‍යාර්ථය ග්‍රහණය කොට ඇති බවයි.

**සතුටුදායක සේ පිළිගත හැකි සාරාංශයක් ලිවීම සඳහා සම්මත රීති කිහිපයක් තිබේ.**

★ දෙන ලද ඡේදය හෝ පාඨය සාරාංශ කළ යුතු වචන ප්‍රමාණය සඳහන් කරනු ලබයි. එසේ නොවන අවස්ථාවක එය ඡේදයෙන් 1/3ක් වන සේ සාරාංශ කළ යුතු වේ.

★ දෙන ලද ඡේදය අවධානයෙන් කියවා එහි මුඛ්‍යාර්ථය තේරුම්ගත යුතු වේ. අවශ්‍ය නම් කිහිප වරක් හෝ කියවීම වැදගත් ය.

★ ඡේදයෙන් කියවෙන මුඛ්‍යාර්ථය එම ඡේදයේ ම හෝ වෙනත් තැනක හෝ සටහන් කර ගැනීමෙන් සාරාංශය ගොනු කර ගැනීම පහසු වේ.

★ සංකීර්ණ වාක්‍යයක ප්‍රධාන අදහස් බෙහෙවින් ඇත්තේ අන්තර් වාක්‍යයේ නොව ප්‍රධාන වාක්‍යයේ ය.

★ ඡේදයේ යොදා ඇති උද්ධෘත පාඨ, ප්‍රකෘති භාෂණ, උපමා, රූපක, අලංකාර පද, අතිශයෝක්ති, විවරණ, නිදර්ශන, උදාහරණ හා අනවශ්‍ය විශේෂණ පද සාරාංශයට ඇතුළත් නොකළ යුතු ය. එකම වචනය නැවත නැවත සාරාංශයට යෙදීමෙන් පුනරුක්ති දෝෂය ද ඇති වන අතර එමගින් සාරාංශය අනවශ්‍ය ලෙස දීර්ඝ වීම ද සිදුවෙයි.

★ උද්ධෘත පාඨ යොදා ප්‍රකෘති භාෂණයෙන් සාරාංශය නොලියා විකෘති භාෂණයෙන් ලිවිය යුතු වේ.

★ මුල් ඡේදයේ යම් ප්‍රකට සත්‍යයක් වුවත් සදෙස් ව කියා ඇති නම් එය එසේ ම ලියන්න. එය නිදෙස් කිරීමේ අයිතිය සාරාංශයේ දී ඔබ සතු නො වේ.

★ සාරාංශය ඕනෑවට වඩා කෙටි වීම ද බරපතල දෝෂයකි.

★ අක්ෂර වින්‍යාසය, විරාම ලකුණු, උක්තාඛ්‍යාත පද සම්බන්ධය ආදිය ගැන ද සාරාංශයේ දී සැලකිලිමත් විය යුතු ය. සාරාංශය පද බෙදීමේ දී මුල් ඡේදය අනුගමනය කිරීම සුදුසු ය. සාරාංශයේ දී ගූඪාර්ථවත්, විපරිතාර්ථවත් වචන භාවිතයෙන් වළකින්න.

★ මුල් පාඨය කියවා නැති අයෙකුට වුව ද එහි අන්තර්ගත සෑම කරුණක් ම මැනවින් අවබෝධ විය යුතු ය.

★ ඡේදයේ මුඛ්‍යාර්ථයට හානියක් නොවී එය ප්‍රකාශ වන ආකාරයට තමන්ගේ ම වචනයෙන් ලිවීමට ඔබට නිදහසක් ඇත.

★ සාරාංශ කිරීමට දෙන කොටසේ ඡේද කීපයක් දක්නට ලැබුණත් සාරාංශයක ඡේද නොබෙදෙන බැවින් සාරාංශ කිරීමේ දී එය තනි ඡේදයක් ලෙස ඉදිරිපත් කළ යුතු වේ.

★ සාරාංශයේදී වාක්‍ය අතර සම්බන්ධතාව ද මැනවින් ආරක්ෂා විය යුතු ය.

★ සාරාංශයට මාතෘකාවක් යෙදීමේදී එය ඉතාමත් කෙටි විය යුතු අතර මුල් ඡේදයේ මුඛ්‍යාර්ථයට ගැළපිය යුතු ය. එසේම මාතෘකාව ප්‍රශ්නාර්ථයක් නොවිය යුතු ය. මාතෘකාව වචන තුනත්, පහත් අතර වීම ප්‍රමාණවත් ය.

**ක්‍රියාකාරකම 11.1**

පහත සඳහන් ඡේද සාරාංශ කර ලියන්න.

1. අවට බලන ඔහුට, ඒ රෑ සිය නගරය ගිනි ගෙන දැවෙන හැටි මොනවට පෙනෙන්නට විය. නගර වැසියන් වෙඩි කාගෙන, මර හඬ දෙමින් නැසෙන සැටිත්, ගැහැනුන් සහ ළමයින් සැනින් සිඳ බිඳ ගිය අත් පා ඇතිව, වැළපෙන සැටිත්, පෙනෙන්නට විය. අන්ධකාරය මෙ වේලේ ඔවුනට මහත් පිටිවහලක් විය. පිස්සු බල්ලන් මෙන් කිසි ඉවක් බවක් නැතිව, ගෙවල් ගිනි තැබීමත්, දුබල ගැහැනුන් සහ ළමයින් කඩුගෑමත්, වස්තු

කොල්ලකෑමත්, විනෝදය කොට ගෙන නොයෙක් සැහැසිකම් කරන, පරංගි හේවායන් මගහරිමින් යුහු-යුහු ව නගරයෙන් පිටත් ව යාමට ඔවුනට අන්ධකාරය මහෝපකාරී විය.

**(විජයබා කොල්ලය)**

2. විද්‍යාව භාෂාවක් වශයෙන් හැඳින්වීම නිවැරදි ය. අදහස් ප්‍රකාශ කිරීමේ හා හුවමාරු කර ගැනීමේ මාධ්‍යයක් වශයෙන් භාෂාව සැලකේ. එවැනි ගණයට අයත් සිංහල, කලාව, ආගම, දේශපාලනය, ඉංග්‍රීසි භාෂා විෂයයන් ද හැඳින්විය හැකි ය. මෙම විෂයයන් ද විද්‍යාව ද නව ක්ෂේත්‍රවලට ප්‍රවේශ වීමටත් එවැනි නව ක්ෂේත්‍රවල දී අවබෝධයක් ලැබීමටත් මිනිසාට හැකි ය. අනෙක් භාෂාවලට මෙන් විද්‍යාවට ද අනුගමනය කළ යුතු විනය පද්ධතියක් නැති නම් ව්‍යාකරණයක් වශයෙන් සැලකිය හැකි විද්‍යාත්මක ක්‍රමයක් ඇත. එසේ ම එහි සාහිත්‍යයක් හෙවත් ග්‍රන්ථකරණයක් සහ කර්තෘවරුන් වශයෙන් සැලකිය හැකි විද්‍යාඥයින් ද ඇත. එසේම විද්‍යාවේ අනු භාෂා වශයෙන් සැලකිය හැකි විවිධ ක්ෂේත්‍ර ඇත. එනම් රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව හා භෞතික විද්‍යාව යනුවෙනි.

**(විද්‍යාත්මක ඥානය)**